# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2224/43 - 2021 අප්‍රේල් මස 23 වැනි සිකුරාදා - 2021.04.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ, මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මවිසින් පනවනු ලබන රෙගුලාසි.

**මහින්ද රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය

2021 අප්‍රේල් මස 23 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී.

රෙගුලාසි

1. මෙම රෙගුලාසි **"2021 අංක 05 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි"** ලෙස හඳුන්වනු ලැබේ.
2. මෙම රෙගුලාසි 2021 අප්‍රේල් මස 23 වැනි දින සිට ක්‍රියාත්මක වේ.
3. පහත සඳහන් අයිතම සහ ඊට අනුරූපී සටහන්, සංශෝධිත, විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි පළ කරන ලද 2017 නොවැම්බර් මස 09 වැනි දිනැති අංක 2044/40 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* I උපලේඛනය ට, මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒ සමගම 2020 අංක 05 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පළ කරන ලද 2020 අගෝස්තු මස 17 දිනැති අංක 2189/4 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* I උපලේඛනයටද ඇතුළත් කරනු ලැබේ.

| | *I තීරුව* **සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය** | *II තීරුව* **සංයෝජිත වර්ගීකරණ සංකේතය** | | *III තීරුව* **විස්තරය** | *IV තීරුව* **ආනයන පාලන බලපත්‍ර** *(L)* |
|---|---|---|---|---|---|
| 251/37 | 87.05 | | | ප්‍රධාන වශයෙන් පුද්ගලයන් හෝ බඩු ප්‍රවාහනය සඳහා සැලසුම් කරන ලද ඒවා හැර, විශේෂ කාර්යය මෝටර් වාහන (උදාහරණ වශයෙන්, ආපදා ලොරි, දොඹකර ලොරි, ගිනි නිවීමේ වාහන, කොන්ක්‍රීට් මිශ්‍ර කිරීමේ ලොරි, මාර්ග අතු ගෑමේ ලොරි, ඉසීමේ ලොරි, ජංගම වැඩපළ, ජංගම රශ්මි විද්‍යා ඒකක) | |

| | I තීරුව<br>සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය | II තීරුව<br>සංයෝජිත වර්ගීකරණ සංකේතය | | III තීරුව<br>විස්තරය | IV තීරුව<br>ආනයන පාලන බලපත්‍ර (L) |
|---|---|---|---|---|---|
| | | 8705.90.00 | - | අනෙකුත් : | |
| | | | --- | ජංගම වැඩපළ | |
| | | 8705.90.42 | ---- | නවීකරණය කරන ලද 87.02 ශීර්ෂයට අයත් වාහන, අවුරුදු තුනකට වඩා පැරණි | L |
| | | 8705.90.44 | ---- | නවීකරණය කරන ලද 87.03 ශීර්ෂයට අයත් වාහන, අවුරුදු තුනකට වඩා පැරණි | L |
| | | 8705.90.46 | ---- | නවීකරණය කරන ලද 87.04 ශීර්ෂයට අයත් වාහන, අවුරුදු තුනකට වඩා පැරණි | L |
| | | 8705.90.48 | ---- | අනෙකුත්, අවුරුදු හතකට වඩා පැරණි | L |
| | | | --- | අනෙකුත්, නවීකරණය කරන ලද 87.02, 87.03 සහ 87.04 ශීර්ෂයට අයත් වාහන : | |
| | | 8705.90.52 | ---- | නවීකරණය කරන ලද 87.02 ශීර්ෂයට අයත් වාහන, අවුරුදු තුනකට වඩා පැරණි | L |
| | | 8705.90.54 | ---- | නවීකරණය කරන ලද 87.03 ශීර්ෂයට අයත් වාහන, අවුරුදු තුනකට වඩා පැරණි | L |
| | | 8705.90.56 | ---- | නවීකරණය කරන ලද 87.04 ශීර්ෂයට අයත් වාහන, අවුරුදු තුනකට වඩා පැරණි | L |
| | | | --- | අනෙකුත් : | |
| | | 8705.90.94 | ---- | දළ වාහන බර ටොන් 4 ඉක්මවූ අවුරුදු හතකට වඩා පැරණි | L |

05 - 148

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.